# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2017 නොවැම්බර් මස 17 වන දින

## II වන කොටස

## අතිරේකය

(2017. 11. 17 දින නිකුත් කරන ලදී)

## විසර්ජන (සංශෝධන)

**2016 අංක 24 දරන විසර්ජන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 6.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් 2016 අංක 24 දරන විසර්ජන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ 2017 වර්ෂය සඳහා රජයේ ණය ලබා ගැනීමේ සීමාව වැඩි කිරීම වේ.

එල්.ඩී.-ඕ. 58/2017

**2016 අංක 24 දරන විසර්ජන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 2017 අංක   දරන විසර්ජන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය.

**2.** 2016 අංක 24 දරන විසර්ජන පනතේ 2 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයෙහි "රුපියල් එක්දහස් පන්සිය හැත්තෑ නව බිලියන එකසිය දහය මිලියන හාරසිය තිස්හය දහසක් නොඉක්මවන්නේ නම්" යන වචන වෙනුවට "රුපියල් එක් දහස් හයසිය විසිනව බිලියනයක් නොඉක්මවන්නේ නම්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

2016 අංක 24 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

2—PL 010459—475 (2017/11)